# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1526/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 05/12/2023<br>පැය 1830 |

## මාධ්‍ය නිවේදනය

**බම්බලපිටිය පොලිස් වසමේ ව්‍යාජ අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම සම්බන්ධව තවත් සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - බම්බලපිටිය පොලිස් ස්ථානය.**

බම්බලපිටිය පොලිස් වසමේ ලෝරිස් පාර ප්‍රදේශයේ දී EVOLVE COLLEGE OF EDUCATION නමින් ව්‍යාජ ලෙස පවත්වාගෙන ගිය අධ්‍යාපන ආයතනයක් වටලා සැකකාරියක් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වූ ඔබ වෙත නිකුත් කරනු ලද 1525/2023 දරණ මාධ්‍ය නිවේදනය හා සබැඳේ.

මෙම ව්‍යාජ අධ්‍යාපන ආයතනය පවත්වාගෙන යාමට ආධාර අනුබල දීම හා ශිෂ්‍යයන් හට ව්‍යාජ තොරතුරු සපයා මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් බම්බලපිටිය පොලිසිය විසින් විමර්ශන සිදුකර තවත් සැකකරුවන් 05 දෙනෙකු පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු 2023.12.05 වන අද දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23, 25 හා 26 වයස්වල පසුවන පිළිවෙලින් පුවක්පිටිය, පල්ලෙවෙල, දෙමටගොඩ, පොළොන්නරුව හා මතුගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් 2023.12.05 වන අද දින අලුත්කඩේ අංක 03 ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එක් අයෙකුට රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුදා හැර ඇත. බම්බලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**